කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2017/2019 සහ

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2017/2018

පළමු සෙමෙස්තරය

**MAS 618 - අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය පැ තුනයි (03)

---

1. අධ්‍යාපනය මඟින් මිනිසුන්ගේ සංස්කෘතිය, ආකල්ප සහ අපේක්ෂාවන් වෙනස් කිරීම තුළින් අධ්‍යාපනයට කිසියම් රටක සංවර්ධනයට දායක විය හැකියැයි ඔබ සිතන්නේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

2. කෘත්‍යවාදීන් සහ මාක්ස්වාදීන් අධ්‍යාපනයේ සමාජ වැදගත්කම විශ්ලේෂණය කළ ආකාරය කෙටියෙන් පහදා එම එළඹුම් දෙක විචාරාත්මකව සසඳන්න.

3. වත්මන් ශ්‍රී ලංකාව තුළ 'උපකාරක පන්ති සංස්කෘතියක්' ජනප්‍රිය වී තිබීම සහ අන්තර්ජාලයේ ව්‍යාප්තිය පාසල සහ ගුරුවරයාගේ අවශ්‍යතාව යටපත් වී ඇතැයි ඔබ සිතන්නේද? සුදුසු න්‍යායාත්මක අදහස් ඇසුරින් විචාරාත්මකව සාකච්ඡා කරන්න.

4. ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටක් තුළ පාසල් අධ්‍යාපනය පිළිබඳ ජෝන් ඩුවීගේ අදහස් ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගැනීමේදී යමෙකුට මුහුණ දීමට සිදු විය හැකි අභියෝග මොනවාද? උදාහරණ සහිතව විචාරාත්මකව විමසන්න.

5. "පාසල් තුළ අසමානාත්මතාව ඇති වන්නේ පාසල අභ්‍යන්තරයේ පවතින සාධක නිසා නොව බාහිර සමාජයේ බලපෑම නිසාය." සුදුසු න්‍යායාත්මක එළඹුම් ඔස්සේ විචාරාත්මකව සාකච්ඡා කරන්න.

6. ගුරුවරයාගේ කාර්යක්ෂමතාව සහ වෘත්තීය තෘප්තිය කෙරෙහි පාසල් පරිසරය බලපාන්නනේයැයි ඔබ සිතන්නේද? උදාහරණ සහිතව පහදන්න.

7. දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි දෙමාපියන්ගේ දායකත්වයේ ඇති වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ මෑත කාලීනව කැපී පෙනේ. මෙය දරුවාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසලේ වගකීම සූක්ෂම ලෙස පවුල වෙත පැවරීමේ උත්සාහයක් ලෙස අර්ථකථනය කළ හැකිද? උදාහරණ සහිතව විචාරාත්මකව සාකච්ඡා කරන්න.

කරුණාකර අනෙක් පිට බලන්න

8. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව කෙටි රචනා ලියන්න:

i. අධ්‍යාපනය හරහා සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනය (Cultural reproduction through education)

ii. අධ්‍යාපනය පිළිබඳ ලිබරල්වාදී පර්යාලෝකය (Liberal perspective on education)

iii. මයිකල් ඇපල් (Michael Apple)

************************

UNIVERSITY OF COLOMBO, SRI LANKA

FACULTY OF ARTS

EXAMINATION IN MASTER OF ARTS IN SOCIOLOGY (TWO YEARS) 2017/2019 &

MASTERS IN SOCIOLOGY (ONE YEAR) 2017/2018

Semester I

# MAS 618 – Sociology of Education

Answer **four (04)** questions only.

**Three (03) Hours**

---

1. Do you think that education can contribute to a country's development by changing culture, people's attitudes and aspirations? Explain with examples.

2. Briefly explain and critically compare the functionalist and Marxist analysis of the social significance of education.

3. Do you think the popularity of a 'tuition class culture' and the availability of Internet facilities in contemporary Sri Lanka has undermined the need for school and teachers? Critically discuss with reference to suitable theories.

4. What are the challenges that one is likely to encounter in attempting to implement John Dewey's ideas on school education in an Asian country like Sri Lanka? Critically examine with examples.

5. "Inequality in schools is a result of the influence of external society and not of factors internal to the school." Critically discuss with reference to suitable theoretical approaches.

6. Do you think that school environment influences a teacher's efficiency and professional satisfaction? Explain with examples.

P.T.O.

7. A discussion on the importance of parental involvement in children's education has become noticeable within the Sri Lankan school system in recent times. Can this be interpreted as an attempt to palm off the school's responsibility in the child's education to the family? Critically discuss with examples.

8. Write short essays on any two (02) of the following topics:
   i. Cultural reproduction through education
   ii. Liberal perspective on education
   iii. Michael Apple

***********************